www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුපියල නිදහසේ කඩා වැටෙද්දී ජීවන වියදම උග්‍රවෙයි

සමන් ගුනදාස විසිනි
2018 ඔක්තෝබර් 1

භාන්ඩ හා සේවා වල මිල දිනෙන් දින ඉහල යාමේ ප්‍රධාන හේතුව වී ඇත්තේ රුපියලේ අනවරත අවප්‍රමානය යි. ආන්ඩුව විසින් බදු පැනවීම හා සහනාධාරවල ඉතුරු පහදු කපා හැරීම අනෙකුත් සාධකයන් වෙයි. දෛනික ව ඉහල යන බඩු මිල නිසා, වැඩ කරන ජනයා මුහුනදී සිටින්නේ වඩ වඩා නරක අතට හැරෙමින් පවතින ජීවන තත්වයකට ය.

ඊනියා මිල සූත්‍රයකට අනුව පෙට්‍රල් හා ඩීසල් මිල සෑම මසක ම ඉහල යන අතර, මැයි මස සිට සැප්තැම්බර් දක්වා පෙට්‍රල් මිල රුපියල් 32කින් ද ඩීසල් මිල රුපියල් 38 කින් ද ඉහල ගොස් ඇත.

පහත දැක්වෙන්නේ මෑත ම සිදු වූ මිල ඉහල යාම් කීපයකි.

* ගෑස් මිල රුපියල් 195 කින්
* පාන් ගෙඩියක මිල රුපියල් පහකින්
* බස් ගාස්තු සියයට 4කින්

මීට අමතරව තිරිඟු පිටි නිෂ්පාදන සියල්ලේ මිල ඉහල ගිය අතර ලබන මාසයේ සිට දුම්රිය ගාස්තු සියයට 15 කින් ඉහල දැමීමට නියමිතය.

මේ වසර තුල මේ දක්වා ශ්‍රී ලංකා රුපියල සියයට 10 කට වඩා අවප්‍රමානය වී ඇති අතර, ඒ අනුව තවත් බොහෝ නිෂ්පාදන හා සේවාවල මිල සර්පිලාකාර ලෙසින් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සැප්තැම්බර් 22දා පැවති උත්සවයක් ඇමතූ අගමැති රනිල් වික්‍රමසිංහ "ඩොලරයේ අගය ඉහල යාම රටෙහි ආර්ථිකය මත නරක ලෙස බලපා ඇති" බව කීවේ ය. "වර්තමාන අර්බුදයට මුහුන දීම සඳහා ඩොලර් මිලියන 500 සිට බිලියන 1 දක්වා ආනයන කපා දැමීම පිනිස බදු පැනවීම සඳහා ආන්ඩුව පියවර ගන්නා" බව ඉන් දෙදිනකට පසු ඔහු පැවසීය.

මෙමගින් වැඩකරන ජනයා මිලට ගන්නා ආනයනික භාන්ඩවල මිල ගනන් තවදුර ඉහල යනු ඇත. ඒ අතර ම, "වැඩි වැඩියෙන් දේශීය නිෂ්පාදන මිලට ගනිමින් සුඛෝපභෝගී භාන්ඩ හා වාහන ආනයනය සීමා කරන" ලෙස සැප්තැම්බර් 25 දා මුදල් ඇමති මංගල සමරවීර මහජනයා හට කියා සිටියේය.

"සුඛෝපභොගී භාන්ඩ" මොනවාදැයි ඔහු සඳහන් නො කලත් එම සැඳහුම නවීන ජීවිතයකට අත්‍යවශ්‍ය ආනයනික භාන්ඩ ගැන විය යුතු ය.

සැප්තැම්බර් 25 දා ප්‍රකාශයක් නිකුත් කල හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආන්ඩුවේ අර්බුදයට හේතුව "දේශීය ලෙස වර්ධනය කෙරුනු ආර්ථික කලමනාකරන මූලෝපායක් නැති කම" යයි කීවේ ය. රාජපක්ෂ තම ආර්ථික කලමනාකරනය ප්‍රක්ෂේපනය කිරීමට යත්න දරන්නේ, දිගු නින්දක සිට අවදි වූ මහජනතාවකට කරුනු ඉදිරිපත් කිරීමක් ලෙසිනි. මහජන සෞඛ්‍යය, අධ්‍යාපනය, අනෙකුත් අත්‍යවශ්‍ය සමාජ සේවාවන් සහ ධීවරයන් හා ගොවීන්ගේ සහනාධාර සඳහා අරමුදල් කප්පාදු කරමින් රාජපක්ෂ ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) නියෝග අනුගමනය කලේ ය. ඔහුගේ පාලනයේ සමස්ත කාලපරිච්ඡේදය පුරා රාජ්‍ය සේවක වැටුප් කැටි කිරීමක් පවත්වාගෙන ගියේ සංගත බදු කප්පාදු කරමින් හා මහා ව්‍යාපාරිකයන්ට අනෙකුත් සහන පුදමිනි.

එලඹෙන සති කිහිපය තුල රුපියල තවදුරටත් අවප්‍රමානය වනු ඇතැයි පුරෝකථනය කරමින් සැප්තැම්බර් 20 දා පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයක් කල මුදල් ඇමති සමරවීර, රුපියලේ පෙර නුවූ විරූ අවප්‍රමානය සාධාරනීකරනය කලේ ය. "මෙම දර්ශක නිවැරදි දිශාවට ගමන් කරමින් තිබෙනවා" යයි කියමින් ඔහු රුපියලේ අවප්‍රමානයට හුරේ දැම් ය. මෙම සැඳහුම් යොමු වී පවතින්නේ, රටෙහි විදේශ මුදල් සංචිතවල කිසිදු මැදිහත් වීමකින් තොර ව මුදලේ කඩාවැටීමට ඉඩහැරීම පිලිබඳ ජාමූඅ හි උපදෙස්වලට යි. සමරවීර පවසන ආකාරයට නය ගෙවීම සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 8 ක විදේශ සංචිතයක් තබාගෙන තිබේ.

අනෙකුත් මුදල් වල අවප්‍රමානය පිලිබඳ ව සඳහන් කරමින් සමරවීර මෙසේ පැවසී ය. "ඉන්දියානු රුපියල සියයට 13.5 කින්, පාකිස්තානු රුපියල සියයට 12.1 කින්, ඉන්දුනීසියාවේ රුපියාව සියයට 9.1 කින් හා රුසියානු රූබලය සියයට 18.2 කින් ඇදවැටෙද්දී ශ්‍රී ලංකා රුපියල කඩාවැටී ඇත්තේ සියයට 7.4 කින් පමනයි" යනුවෙන් ඔහු සඳහන් කලේ ය. ඒ හුස්මට ම "රුපියලේ අවප්‍රමානය වීම ආර්ථිකයේ කඩාවැටීමක් ලෙස අදහස් කිරීම වැරදි" යැයි ඔහු පැවසීය.

සත්‍ය වසයෙන් සිදුවෙමින් පවතින්නේ ගෝලීය ආර්ථික අර්බුදයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ

ආර්ථිකය කඩාවැටීම යි. මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමිගේ විස්තරය මෙම කඩාවැටීම වැඩිදුර තහවුරු කලේ ය. රුපියලේ අවප්‍රමානයට හේතු තුනක් ඔහු ගෙනහැර දැක්වී ය. එක්සත් ජනපදයේ පොලී අනුපාත ඉහල යාම හේතුවෙන් මතු වෙමින් පවත්නා වෙලඳපොලවලින් විශාල ලෙස එක්සත් ජනපදයට ප්‍රාග්ධනය ගලායාම, එක්සත් ජනපදය හා චීනය අතර තීව්‍ර වන වෙලඳ යුද්ධය, ඉරානය මත සම්බාධක හා මැද පෙරදිග ආතතීන්වල ප්‍රතිඵලයක් ලෙස ආයෝජකයින් එක්සත් ජනපද ඩොලරය වැනි ආරක්ෂා සහගත මුදල් කරා මාරු වීම, සහ ශුද්ධ තෙල් ආනයනකරුවෙකු ලෙස හුවමාරු අනුපාත හා ඩොලර් සංචිත මත ඇති වන පීඩනය එම හේතූන් ය.

මේ සියල්ල පෙන්වා දෙන්නේ ජාත්‍යන්තර පරිමාන ව ධනවාදී පර්යායේ ගැඹුරු වන අර්බුදය හා රටෙහි ආර්ථිකය මත එම අර්බුදයේ බලපෑම යි.

ජාමූඅ හි නියෝග මත, ධනවාදයේ පද්ධතිගත අර්බුදයේ සියලු බර වැඩකරන දුගී ජනයා මත ආන්ඩුව විසින් පටවමින් සිටින්නේ, මහා ව්‍යාපාරිකයන් හා ධනවතුන් හට එහි බලපෑම අවම කරමිනි.

ආන්ඩුව අප්‍රේල් මාසයේ දී ජාමූඅ විසින් ඇනවූ පරිදි සාමාන්‍ය මහජනයාගේ සියලු කොටස් මත බදුබර පටවමින් බදු නීති ක්‍රියාත්මක කලේ සංගත හා ධනවතුන්ගෙන් අය කෙරෙන බදු ගෝලීය ව අවම මට්ටම් වන සියයට 14-28 අතර තබමිනි. තව ද විශාල ආයෝජන කරන මහා ව්‍යාපාරිකයන්ට ආන්ඩුවේ අභිමතය පරිදි සීමාරහිත බදු සහන ද සම්පාදනය කෙරුනි.

පසුගිය මූල්‍ය වර්ෂය අවසානයේ කොටස් වෙලඳපොලේ ලියාපදිංචි සමාගම් ඒවායේ ආදායම සියයට 11 කින් ඉහල දමා ගත්තේ, බැංකු හා මූල්‍ය, සන්නිවේදන, ආහාර, මධ්‍යසාර සහ දුම්කොල වැනි සමහර ව්‍යාපාර සියයට 22 සිට 33 දක්වා වන ආදායම් වැඩිවීමක් වාර්තා කරද්දී ය.

මීට විපරීත ව, පසුගිය වසර තුල පුද්ගලික හා රාජ්‍ය අංශවල කම්කරුවන්ගේ වැටුප් පිලිවෙලින් සියයට 5 කින් හා 7 කින් කඩාවැටුනි. මේ වසර සඳහා වන සංඛ්‍යාලේඛන තවමත් පල වී නැතත් සැබෑ වැටුප් මත බලපෑම මේ වසරේදී වඩා වැඩි විය යුතු ය. අගෝස්තු මාසයේ දී පසුගිය වසරට සාපේක්ෂ ව නිල උද්ධමනය සියයට 5.9 ක් වූයේ මේ වසර තුල වැඩි ම අගය වාර්තා කරමිනි.

අරමුදල් හා සහනාධාර කපා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස තමා මුහුන දෙන රුදුරු ජීවන හා සමාජ කොන්දේසීන් වලටද පොලිස් මර්දනයට ද එරෙහිව කම්කරුවන්ගේ වැඩ වර්ජන හා ගම්බද ජනයාගේ විවිධාකාර අරගලයන් ද ඉස්මතු වීම කෙරෙහි ඔවුන් අතර පැසෙමින් පවත්නා අතෘප්තිය හේතු වී ඇත. අධ්‍යාපනය සඳහා අරමුදල් කපමින් පුද්ගලික අධ්‍යාපනය දිරිමත් කිරීමේ ආන්ඩුවේ පිලිවෙත්වලට විරුද්ධ ව ශිෂ්‍යයෝ දිග්ගැස්සුනු අරගලවල නිරත වෙති.

වර්තමානයේ තමන් මුහුන දෙන කොන්දේසි පිලිබඳව වතුකරයේ හා දුම්රිය සේවයේ කම්කරුවෝ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කතා කල හ.

"අහස උසට නගිමින් තිබෙන ජීවන වියදම නිසා වතුකම්කරුවන් නය බරින් මිරිකී සිටිනවා. දරාගත නො හැකි ජීවන වියදම නිසා වතුකරයේ ප්‍රදේශවලින් දිවි නසාගැනීමේ සිද්ධීන් ද වාර්තා වුනා" යයි දික්ඔය ඇන්ෆීල්ඩ් වත්තේ පද්මනාදන් කීවේ ය. මිල ඉහල යාම් ලැයිස්තුවක් පෙන්වමින් "අපි ජීවත් වෙන්නේ කොහොම ද අපේ දරුවන්ට උගන්වන්නේ කොහොම ද" යයි ඔහු විමසී ය.

තමන් සාමාජිකත්වය දරන වෘත්තීය සමිතිය ගැන ඔහු විවේචනශීලී විය: "මම ලංකා කම්කරු කොංග්‍රසයේ සාමාජිකයෙක්. හැම සමිතියක් ම වැඩකරන්නෙ කම්කරුවො බෙදන්න. ඒගොල්ලො කම්කරුවන්ගෙ අයිතීන්වලට සටන් කරන්නේ නැහැ, ඔක්කොම සමිති කලමනාකරනයත් එක්ක එකතුවෙලා ඉන්නෙ. ඒගොල්ලො කම්කරුවන් ව රවට්ටනවා."

අරගලයන් තම අතට ගැනීම සඳහා වෘත්තීය සමිතිවලින් බිඳී වෙන්වී කම්කරු ක්‍රියාකාරී කමිටු පිහිටුවීම ගැන විමසූ විට ඔහු මෙසේ කීවේ ය: "අපිට ජීවිතය ගැට ගසා ගැනීමට නම් දැනට දවසකට ගෙවන රුපියල් 500ක් වගේ දෙගුනයකටත් වැඩිය වැටුප් ඕන. වෘත්තීය සමිති වෙනුවට මේ වෙනුවෙන් අරගල කරන්න කම්කරුවො ඉදිරියට ඇවිත් ක්‍රියාකාරී කමිටු හදන්න ඕන කියන එක මම පිලිගන්නවා."

දුම්රිය දෙපාර්තමේන්තුවේ ලිපිකරුවෙක් මෙසේ කීවේ ය: "ආන්ඩුව කිසි ලජ්ජාවක් නැතුව මිල ගනන් ඉහල දානවා. මෙය පෙර නුවූ විරූ දෙයක්. දුම්රිය කම්කරුවො අතර අතෘප්තියක් වගේ ම වැඩි වන ජීවන වියදම ගැන සැහෙන විවේචනයකුත් තියෙනවා. අපිට කරන්නෙ මොකක්ද කියල හිතාගන්න වත් බැරි වේගයකින් දේවල් වෙනස් වෙනවා. ආන්ඩුව වෙනස් කරන්න ඕන කියල බොහෝ දෙනෙක් කියනව. ඒත් අලුත් ආන්ඩුවක් ආවත් අපේ ඉරනම ඒකමයි, කියල අපිට දැනෙනව."

දුම්රිය වෘත්තීය සමිති ගැන ඔහු මෙසේ පැවසී ය: "දුම්රිය ක්ෂේත්‍රයෙ එකම සමිති නායකයෙක් වත් ජීවන වියදම ගැන වචනයක් කතාකරන්නෙ නැහැ. ආන්ඩුවේ සමිතිවලට කියන්න දෙයක් නැහැ. අලුත් විකල්පයක් තියනවානම් බොහෝ කම්කරුවො ආකර්ෂනය කරගන්න වාතාවරනයක් තියෙනවා."

"වෘත්තීය සමිතිවල පාවාදීම්වලට විරුද්ධ ව ක්‍රියාකාරී කමිටු ගොඩ නැගීම හොඳ අදහසක්. මේ අරාජික තත්ත්වය හා පීඩනය යටතෙ කම්කරුවන් ව උනන්දු කලොත් ඔවුන් සාර්ථක ක්‍රියාකරී කමිටුවක් ගොඩනගාවි" යයි ඔහු කීවේ ය.

© www.wsws.org